සොරණාතොට ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 20 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.643,469,478 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය සඳහා ඔප්පු පිඹුරුපත්,පැවරුම් නියෝග සහ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් ලිපිය පරිදි නිලධාරි මණ්ඩලයක් පත් කර යවා ඇත. |

### 1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104(1) හා (3) | ට්‍රැක්ටර් රථයක බැටරියක් සහ කැබ් රථයක ගලවා ඉවත් කරනලද එන්ජිම හා ඊට අදාල තවත් කොටස් අස්ථානගතවී තිබුණු නමුත්,ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ව රයා වෙත දන්වා යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් දේපල වර්ෂ 5 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද කඩ කාමර 23 ක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තක්සේරු වාර්තාවක් ලබාගැනීමට දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.796,747 ක් වු අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු.1,022,489 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් බදු | 2,121,374 | 2,142,085 | 1,655,641 | 486,443 | 1,696,724 | 1,999,931 | 1,578,052 | 421,879 |
| ii. | කඩකුලී | 537,800 | 562,108 | 454,173 | 107,935 | 388,800 | 421,418 | 396,697 | 24,722 |
| iii. | බලපත්‍ර ගාස්තු | 4,849,525 | 4,847,738 | **376** | 4,847,361 | 3,529,851 | 4,221,403 | 689,814 | 3,531,589 |
| iv. | වෙනත් ආදායම් | - | - | - | - | - | - | - | - |
| | එකතුව | 7,508,699 | 7,551,931 | 2,110,190 | 5,441,739 | 5,615,375 | 6,642,752 | 2,664,563 | 3,978,190 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන හිඟ ආදායම් රු.10,624,477 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | 2020 අප්‍රේල් 30 දිනට රු.3,028,439 ක් අය කරගෙන ඇත. |

**2.2.3** **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.2,000,000 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.2,844,525 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2020 අප්‍රේල් 30 දිනට මුද්දර ගාස්තු රු.1,958,674 ක් සහ උසාවි දඩ රු.756,374 ක් අය කරගෙන ඇත. |

**3.** **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1** **<u>කාර්ය සාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

**<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ “ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” පිළිබඳව දැනුවත්වී තිබුණදසභාවට අදාල කර ගත , හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා .දර්ශක හඳුනාගෙන නොතිබුණි | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් හඳුනා ගැනීමේ දර්ශක සිව් අවුරුදු සැලැස්ම තුල දක්වා ඇත. |

**3.2** **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජල ව්‍යාපෘති 14 ක ආදායම ඉක්ම වු වියදම රු.1,698,800 ක් විය. | වියදම් අවම කර ගනිමින් සේවා සැපයිය යුතුවේ. | ඉදිරියේදී ඒකකයකට අය කරන මුදල් ප්‍රමාණය යම් ප්‍රතිශතයකින් ඉහළ නංවා මෙම පාඩුව අවම කරගැනිමට පියවර ගනිමි. |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට 2018 හා 2019 වර්ෂ වලට අදාල හිඟ ණයවාරික රු.981,672 ක් ගෙවා නොතිබුණි. | වාරික මුදල් නියමිත පරිදි ගෙවිය යුතුවේ. | එම මුදල ගෙවිමට අපහසු බැවින්,ණය මුදල කපා හැරිමට කටයුතු කරන ලෙසට දන්වා යවා ඇත. |
| (ඇ) | වසර 05 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණයහිමියෝ රු.16,132,397 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. | මේවන විට කොටසක් පියවා ඇත. |

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 05 කට අදාළව සිටි සේවක අතිරික්තය 13 ක් වූ අතර තනතුරු 06 කට අදාලව සේවක පුරප්පාඩු 07 ක් පැවතුනි. | අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කරගැනීම හා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට යවා ඇත. පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවති. |

## 4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

## 4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල විගණන මා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී එම ප්‍රමාදය මඟහරවාගෙන නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරන බව. |

## 4.2 <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | නියමිත පරිදි පැවැත්වීමට නොහැකි විය. |